254

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (2018)

## (01) පාසල් පරිපාලනය හා අධීක්ෂණය

පැ තුනයි

**පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**1.** පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට **කෙටි පිළිතුරු** සපයන්න.

(i) පාසලක කාලසටහන සකස් කිරීමේ දී තොරතුරු ලබා ගත යුතු පාර්ශ්ව **හතරක්** නම් කරන්න.

(ii) 10 වන වසරට අදාළ යම් විෂයයක් ඉගැන්වීම සඳහා ගුරුවරයකු තෝරා ගැනීමේ දී විදුහල්පති ලෙස ඔබ සලකා බලන ප්‍රධාන කරුණු **හතරක්** සඳහන් කරන්න.

(iii) විදුහල්පති හැර පාසැල් සංවර්ධන කමිටුවට පත්වන නියෝජිතයින් කාණ්ඩ හතර නම් කරන්න.

(iv) පාසල් ප්‍රසම්පාදන කමිටුව විසින් මුදල් අනුමත කිරීම සිදුකරන පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වර්ග **හතරක්** දක්වන්න.

(v) පාසල් පාදක ගුරු සංවර්ධනය පාසලකට වාසිදායක වීමට හේතු **දෙකක්** ලියන්න.

(vi) අභ්‍යන්තර ඇගයීම සඳහා විදුහල්පතිට යොදා ගත හැකි ඇගයුම්කරුවන් **හතරක්** සඳහන් කරන්න.

(vii) පාසලක සංවර්ධන කටයුතු සඳහා බාහිර ප්‍රජාව සම්බන්ධ කර ගත හැකි අවස්ථා **හතරක්** සඳහන් කරන්න.

(viii) විදුහල්පතිවරයකු සතුවිය යුතු කළමනාකරණ ගුණාංග **හතරක්** නම් කරන්න.

(ix) පාසල කෙරෙහි ආදි ශිෂ්‍යයන් තුළ හිතකර ආකල්ප සංවර්ධනය සඳහා විදුහල්පතිවරයකුට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.

(x) ප්‍රාථමික අධ්‍යාපනයේ අවධි **තුනට** සහ කණිෂ්ඨ අධ්‍යාපනයේ අවධි දෙකට අදාළ ශ්‍රේණි වෙනවෙනම නම් කරන්න.

*(ලකුණු 04 × 10 = 40 යි)*

**2.** (i) පාසල් පාදක කළමනාකරණයේ ප්‍රධාන අරමුණු **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

(ii) පාසැල් සංවර්ධන කමිටුවට පැවරෙන ප්‍රධාන කාර්යයන් **පහක්** සඳහන් කරන්න.

(iii) පාසැල් සංවර්ධන කමිටු සාමාජිකයකුගේ නිලය **අහෝසිවන** අවස්ථා **පහක්** පැහැදිලිව දක්වන්න.

*(ලකුණු 15 යි)*

**3.** (i) නව විෂය නිර්දේශවලට අනුව 10 -11 ශ්‍රේණිවල දරුවන් පාසලේ දී හැදෑරිය යුතු හර විෂයන් **හය** සඳහන් කරන්න.

(ii) වර්ෂ 2016 දක්වා පැවති 12 ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා ශිෂ්‍යයෙකු අවම වශයෙන් ලබා ගත යුතු අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සාමාර්ථ තත්ත්වය පැහැදිලිව දක්වන්න.

(iii) පාසැල් කාලසටහනක් සැකසීමේ දී එහි සම්මත බව ආරක්ෂා කර ගැනීම සඳහා විදුහල්පතිවරයා විසින් ගත යුතු පියවර කෙටියෙන් සඳහන් කරන්න.

*(ලකුණු 15 යි)*

**4.** (i) ව්‍යාපෘති ක්‍රියාවලියක තිබෙන ප්‍රධාන පියවර **හය** පිළිවෙළින් සඳහන් කරන්න.

(ii) ව්‍යාපෘති ලිවීමේ දී සැලකිය යුතු කරුණු **හය** ලියන්න.

(iii) ව්‍යාපෘති කළමනාකරණයේ දී විදුහල්පතිවරයකු ලෙස ඔබට ඇති වගකීම් සැකෙවින් පැහැදිලි කරන්න.

*(ලකුණු 15 යි)*

[ 2 වන පිටුව බලන්න.

5. (i) කෘප්තිමත් ගුරු මණ්ඩලයක් සිටීම පාසැලේ කාර්යක්ෂමතාව ඉහළ අගයක පවත්වා ගැනීමට ඉවහල්වන ආකාරය පැහැදිලි කරන්න.

(ii) කෘප්තිමත් ගුරු මණ්ඩලයක් ඇති කර ගැනීමට විදුහල්පති ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග පහක් විස්තර කරන්න.

(iii) ගුරු සුබසාධනය සඳහා ඔබගේ පාසලේ ක්‍රියාත්මක කර ඇති ක්‍රියාමාර්ග පහක් විස්තර කරන්න.

*(ලකුණු 15 යි)*

6. (i) ප්‍රජා සංවර්ධනය සඳහා පාසැලට දායකත්වය දැක්විය හැකි ආකාර පහක් කෙටියෙන් විස්තර කරන්න.

(ii) බඩු වට්ටෝරු පොතට ඇතුළත් කළ යුතු භාණ්ඩ පාසල වෙත ලැබෙන මූලාශ්‍ර හතරක් සඳහන් කරන්න. එසේ ලැබෙන භාණ්ඩ වට්ටෝරු පොතේ ඇතුළත් කිරීමේ දී සඳහන් කළ යුතු කරුණු මොනවා ද?

(iii) වාර්ෂිකව වට්ටෝරු පොත් තුලනය කිරීම සිදුකරන ආකාරය විස්තර කරන්න. භාවිත කළ නොහැකි ලෙස අබලි වී දිරාපත්ව ඇති ලීබඩු ඉන්වෙන්ට්‍රියෙන් ඉවත් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගය කෙටියෙන් විස්තර කරන්න.

*(ලකුණු 15 යි)*

7. පහත සඳහන් එකිනෙක අතර වෙනස උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(i) පාසැල් අභ්‍යන්තර ප්‍රජාව සහ බාහිර ප්‍රජාව

(ii) විධිමත් විෂයමාලාව සහ සැඟවුන විෂයමාලාව

(iii) පාසැලක විධිමත් සන්නිවේදන කාරක සහ අවිධිමත් සන්නිවේදන කාරක

(iv) විමසීමෙන් තීරණ ගැනීමේ ශෛලිය හා සහභාගිත්ව තීරණ ගැනීමේ ශෛලිය

(v) සායනික අධීක්ෂණය සහ සමඅධීක්ෂණය

*(ලකුණු 15 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (2018)

## (02) පාසල් සැලසුම්කරණය

පැ තුනයි

**පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**1.** පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට කෙටි පිළිතුරු සපයන්න.

(i) පාසලක වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම එක් වර්ෂයක් සඳහා වන අතර එවැන්නක විස්තර වශයෙන් අඩංගු විය යුතු කරුණු හතරක් ලියන්න.

(ii) ව්‍යාපෘතියක අරමුණු ලිවීමේ දී අරමුණුවල තිබිය යුතු යැයි පිළිගන්නා විශේෂ ලක්ෂණ හතරක් ලියන්න.

(iii) පාසල් සැලසුම්කරණ ක්‍රියාවලියේ ප්‍රධාන පියවර හතරක් ලියන්න.

(iv) අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (ESDFP) යටතේ පළමුවැනි තේමාව වන දරුවන්ට ප්‍රාථමික හා ද්විතීය අධ්‍යාපන සම සාධාරණ අවස්ථා ලබා දීම පිණිස රජය විසින් සංවර්ධනාත්මකව ගන්නා පියවර හතරක් ලියන්න.

(v) අධ්‍යාපන ආංශික රාමුව හා වැඩසටහන යටතේ හඳුන්වා දී ඇති

(අ) තුන්වන තේමාව කුමක් ද?

(ආ) එම තේමාව යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

(vi) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති පැහැදිලි කරන රජයේ නිල ප්‍රකාශනය කුමක් ද?

(vii) යහපත් මානව සම්බන්ධතා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම පිණිස පාසල් සංවර්ධන සැලැස්මකට ඇතුළත් කර ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති දෙකක් සඳහන් කරන්න.

(viii) පාසලකට සංවර්ධන සැලැස්මක් සකස් කරන විට 'තත්ත්ව විශ්ලේෂණය' පිණිස ලේඛන පරීක්ෂාවේ දී අනාවරණය කර ගත හැකි වන ප්‍රධාන සාධක හතරක් ලියන්න.

(ix) අධ්‍යාපන සැලසුම්කරණය පිළිබඳව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය සතු ප්‍රධාන වගකීම් හතරක් ලියන්න.

(x) "විෂය සමගාමී ක්‍රියාකාරකම්"වලට අදාළ ව්‍යාපෘති, පාසල් සංවර්ධන සැලසුම්වලට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමෙන් සිසුන්ට අත්වන වාසි හතරක් ලියන්න.

*(ලකුණු 04 × 10 = 40 යි)*

**2.** (i) "පාසල් පාදක සැලසුම්කරණය ක්‍රියාත්මක කිරීමේ දී පාසල් බලධාරීන් මුහුණ දෙන අභියෝගයන්ට සාර්ථකව මුහුණ දී තම කාර්යයන් ඉටු කිරීමෙන් සිය කාර්යසාධනය පිළිබඳව සතුටට පත්විය හැකි ය."
මෙම කියමන සනාථ කිරීමට සාධක වන කරුණු දෙකක් පැහැදිලි කරන්න.

(ii) 'පාසල් පාදක සැලසුම්කරණය' අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල් පද්ධතියට හඳුන්වා දී දසක දෙකකට ආසන්න කාලයක් ගත වුව ද, තවමත් නිසි ක්‍රමවේදය මත පාසල් සැලසුම් සකස්ව ක්‍රියාත්මක වන බවක් නොපෙනේ. එසේ වීමට හේතු ලෙස ඔබ දකින කරුණු තුනක් පැහැදිලි කරන්න.

(iii) (අ) පාසල් සැලැස්මකට ඇතුළත් කර ක්‍රියාත්මක කළ හැකි ඔබ කැමති වැඩසටහන් දෙකක් ලියා ඒ එක එකක් යටතේ ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති එක බැගින් සඳහන් කරන්න.

(ආ) ඉන් එක් ව්‍යාපෘතියක අඩංගු විය යුතු මූලික ලක්ෂණ හතරක් ලියන්න.

*(ලකුණු 15 යි)*

**3.** (i) පාසලක සැලසුම් සකස් කිරීමේ දී එම පාසලේ අරමුණු ඉටු කර ගැනීම පිණිස එම සැලැස්මේ වැඩසටහන් හා ව්‍යාපෘති, ඉලක්ක විය යුතුය. පාසලක අරමුණු තීරණය කිරීමෙහි ලා බලපාන සාධක තුනක් ලියන්න.

(ii) "පාසල්වල අරමුණු පාසලින් පාසලට වෙනස් වේ." මේ සඳහා බලපාන හේතු දෙකක් පැහැදිලි කරන්න.

(iii) පාසලක 'දැක්ම (Vision)' හා 'මෙහෙවර (Mission)' අතර ඇති සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

*(ලකුණු 15 යි)*

[ 2 වන පිටුව බලන්න.

**4.** (i) පාසල් සැලසුම් සකස් කිරීමේ දී බලධාරීන් විභාග ප්‍රතිඵල වර්ධනය කිරීමේ වැඩසටහන්වලට පමණක් සීමා නොවිය යුතුය. සංයුක්ත සැලැස්මක් සකස් කිරීමේ දී පාසල් බලධාරීන් අවධානය යොමු කළ යුතු වෙනත් ක්ෂේත්‍ර පහක් ලියන්න.

(ii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළින් වර්ධනය කරගත යුතු යැයි දක්වා ඇති එක් නිපුණතාවකි, "සිසුන්, ක්‍රීඩාව හා විවේකය ඵලදායි ලෙස ගත කිරීමට හුරු කිරීමේ නිපුණතාව"

(අ) ඉහත නිපුණතාව සිසුන්ට අත්පත් කර දීම පිණිස පාසල් සංවර්ධන සැලැස්මකට ඇතුළත් කළ හැකි වැඩසටහන් දෙකක් නම් කරන්න.

(ආ) ඉන් එක් වැඩසටහනක් යටතේ ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ඉ) ඉහත නිපුණතාව හැරුණු විට ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියෙන් සිසුන් තුළ වර්ධනය කර ගත යුතු යැයි දක්වා ඇති නිපුණතා තුනක් ලියන්න.

*(ලකුණු 15 යි)*

**5.** (i) පාසලක "අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (Education Management Information System)" යාවත්කාලීනව පවත්වා ගෙන යාම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට හේතු වේ. එය පහත දැක්වෙන ශීර්ෂ දෙක ඔස්සේ පැහැදිලි කරන්න.

(අ) ජාතික විභාග ප්‍රතිඵල වාර්ෂිකව යාවත්කාලීනව පවත්වා ගැනීම

(ආ) භෞතික සම්පත් පිළිබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වා ගෙනයාම

(ii) පාසල් නගා සිටුවීමේ වැඩසටහන යටතේ හඳුන්වා දී ඇති

(අ) පාසල් සංවර්ධන කමිටුව,

(ආ) පාසල් කළමනාකරණ කමිටුව

(ඉ) පාසල් සංවර්ධන සැලසුම්

අතර පවතින සම්බන්ධය කෙබඳු දැයි පැහැදිලි කරන්න.

(iii) "අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය"ට ඇතුළත්, පාසලක ක්‍රියාත්මක විෂයමාලාව සම්බන්ධ තොරතුරු පාසල් විෂයමාලා සංවර්ධනයට පදනම් කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

*(ලකුණු 15 යි)*

**6.** (i) පාසලක "ප්‍රාග්ධන වත්කම් කළමනාකරණ සැලැස්මක්" යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි සංක්ෂිප්තව පැහැදිලි කරන්න.

(ii) පාසල් සංවර්ධන සැලසුම් සකස් කරන පාසල් සංවර්ධන කමිටුවේ ක්‍රියාකාරිත්වය අසතුටුදායක වූ අවස්ථාවක දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට ගත හැකි පියවර තුනක් ලියන්න.

(iii) පාසලක වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම හා මධ්‍යකාලීන සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීමේ දී පාසලේ පවත්වා ගෙන යා යුතු ප්‍රධාන ලේඛන පහක් ලියන්න.

*(ලකුණු 15 යි)*

**7.** පහත සඳහන් කරුණු එකිනෙක අතර පවතින සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) පාසලක තත්ත්ව විශ්ලේෂණය හා ගැටලු ප්‍රමුඛකරණය

(ii) පාසල් සංවර්ධනයට ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම්

(iii) සැලසුම් හා පෙරළුම් සැලසුම්

(iv) පාසල් සංවර්ධන කමිටුව හා අනුකමිටු

(v) පාසල් සංවර්ධන සැලැස්ම හා වාර්ෂික කාර්යසාධන වාර්තාව (School Annual Performance Report)

*(ලකුණු 03 × 5 = 15 යි)*

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (2018)

## (03) අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර

පැ තුනයි

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට කෙටි පිළිතුරු සපයන්න.

(i) අධ්‍යාපන අමාත්‍යාංශය හා කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් කේන්ද්‍රය (NEREC) මගින් 4 වන ශ්‍රේණියේ සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් මැනීම සඳහා පවත්වනු ලබන ජාතික ඇගයීමට ගැනෙන විෂයන් තුන නම් කරන්න.

(ii) අධ්‍යාපන අමාත්‍යාංශය හා කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් කේන්ද්‍රය මගින් 8 වන ශ්‍රේණියේ සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් මැනීම සඳහා පවත්වනු ලබන ජාතික ඇගයීමට ගැනෙන විෂයන් තුන නම් කරන්න.

(iii) තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් (Sustainable Development Goals) අතුරින් සෘජුවම අධ්‍යාපනය හා සම්බන්ධ වනුයේ කීවෙනි අභිමතාර්ථය ද? එය නම් කරන්න.

(iv) විදුහල්පතිවරයකු ලෙස කටයුතු කිරීමේ දී පාසල් නායකත්ව හා කළමනාකරණ නිපුණතා ලෙස අත්පත් කර ගත යුතු ප්‍රධාන නිපුණතා ක්ෂේත්‍ර (Competency Domain) දෙකක් නම් කරන්න.

(v) අධ්‍යාපන ලේකම්ගේ අංක 23/2017 හා 2017.06.01 දාතම පාසල පදනම් කරගත් තක්සේරුකරණය (SBA) වර්ෂ 2017 හා ඉන් ඉදිරියට ක්‍රියාත්මක වනුයේ කුමන ශ්‍රේණි සහ කුමන විෂයයන් සඳහා ද?

(vi) අධ්‍යාපනය සඳහා සම සාධාරණ ප්‍රවේශ අවස්ථා හා සහභාගිත්වය ඉහළ නැංවීම සඳහාත් නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය තහවුරු වන අන්දමින් භෞතික හා අනෙකුත් අධ්‍යාපන සම්පත් සැපිරීම සඳහාත් රජය විසින් 2015 වර්ෂයේ සිට දැවැන්ත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් සිටී. එම ව්‍යාපෘතිය කුමක් ද?

(vii) නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය තහවුරු වන අන්දමින් සිසුන්ගේ සෞඛ්‍ය සම්පන්න බව සුරකීමට රජය විසින් 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති ප්‍රධාන ජාතික වැඩසටහන නම් කරන්න.

(viii) අධ්‍යාපන ලේකම්ගේ අංක 7/2013 දරන චක්‍රලේඛයට අනුව පාසල් සංවර්ධන කමිටුව සමන්විත වන සංයුති කාණ්ඩ පහ නම් කරන්න.

(ix) "සමාජ සංහිඳියාව හා ඒකාග්‍රතාවය" යන්න තිරසාර ලෙස පවත්වාගෙන යාම, කෙටිකාලීනව කඩිනමින් කළ හැකි කාර්යයක් නොවේ. ඊට දැවැන්ත ආකල්පමය වෙනසක් කළ යුතුය. මේ සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවර තුනක් නම් කරන්න.

(x) අධ්‍යාපන සංවර්ධන සැලසුම්කරණයේ දී දැනට අනුගමනය කරනු ලබන ප්‍රවේශය (Approach) කුමක් ද?

*(ලකුණු 04 × 10 = 40 යි)*

2. අධ්‍යාපන නවීකරණ යෝජනා යටතේ 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන ප්‍රතිපත්තිය යටතේ 12 හා 13 ශ්‍රේණි සඳහා වෘත්තීය නැඹුරුවක් සහිත විෂය ධාරාවක් හඳුන්වා දී ඇත. 2017 වර්ෂයේ මෙම වැඩසටහන නියමුකරණ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වේ.

(i) මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම හරහා සිසුන්ට, අධ්‍යාපන පද්ධතියට ලැබෙන ප්‍රධාන වාසි කවරේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

(ii) මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ කරන යෝජනා තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

[ 2 වැනි පිටුව බලන්න.

**3.** අධ්‍යාපන ලේකම්ගේ අංක 07/2013 දරන චක්‍රලේඛය හරහා පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් බලතල රැසක් පාසල වෙත විමධ්‍යගත කොට ඇත.

(i) පාසල් කළමනාකරණය හා සංවර්ධනය සම්බන්ධයෙන් උක්ත චක්‍රලේඛයට අනුව පාසල්වල ක්‍රියාත්මක වන ප්‍රධාන කමිටු දෙක නම් කරන්න. *(ලකුණු 05 යි)*

(ii) මෙම චක්‍රලේඛය හරහා සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් ඉහළ නැංවීමට අදාළව ලැබෙන ප්‍රධාන ප්‍රයෝජන **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

**4.** ශිෂ්‍ය ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් මැනීම සඳහා ලෝකයේ බොහෝ රටවල් ජාත්‍යන්තර ඇගයීම් (International Assessment) සඳහා සහභාගි වෙති.

(i) එවැනි ජාත්‍යන්තර ඇගයීම් **දෙකක්** නම් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) එවැනි ජාත්‍යන්තර ඇගයීම් සඳහා සහභාගි වීම හරහා අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය සඳහා ලබා ගත හැකි ප්‍රධාන ප්‍රයෝජන **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 09 යි)*

**5.** අධ්‍යාපන අත්පත් කර ගැනීම් සඳහා හා අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය සහතිකකරණය සඳහා නියාමනය, සුපරීක්ෂණය හා ප්‍රමිතිකරණය අත්‍යාවශ්‍ය මෙවලමකි.

(i) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත "ස්වාධීන පාසල් සුපරීක්ෂණ සේවාව / මණ්ඩලය" යටතේ අත්පත් කර ගත හැකි ප්‍රයෝජන **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන පද්ධතිය තුළ කඩිනමින් සිදු කළ යුතු වෙනස්කම් / ප්‍රතිශෝධන කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 09 යි)*

**6.** පාසල් පද්ධතිය තුළ මෙතෙක් ක්‍රියාත්මක වූ "පාසල් පාදක ගුරු සංවර්ධන (School-based Teacher Development) වැඩසටහන" වැඩිදියුණු කළ ආකෘතියක් ලෙස 2018 වර්ෂයේ සිට "පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන (School-based Professional Teacher Development) වැඩසටහන" ලෙස ක්‍රියාත්මක වේ.

(i) පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන පාසල්වල ක්‍රියාත්මක කිරීමේ දී ඔබ මුහුණ දෙන ප්‍රධාන ගැටලු **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන පාසල් මට්ටමින් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ කරන නිර්මාණශීලි යෝජනා **තුනක්** සැකෙවින් පැහැදිලි කරන්න. *(ලකුණු 09 යි)*

**7.** පාසල් මට්ටමින් තොරතුරු තාක්ෂණ විෂය ප්‍රවර්ධනය උදෙසා හා එම විෂය හැදෑරීමට අවස්ථා සැලසීම සඳහාත් සිසුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහාත්, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ e-පුස්තකාල (e - libraries) ස්ථාපිත කිරීමට යෝජනා වී ඇත.

(i) e-පුස්තකාල ප්‍රවර්ධනය තුළින් සිසුන්ගේ ඉගෙනුම් ඵල ඉහළ නැංවීමට බලපාන යහපත් සාධක / ප්‍රයෝජන **තුනක්** නම් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) මෙම යෝජනාව සම්බන්ධයෙන් ඇති විය හැකි අයහපත් බලපෑම් කවරේ ද? එම අයහපත් බලපෑම් අවම කර ගැනීමට ගත හැකි පියවර කවරේ ද? *(ලකුණු 09 යි)*

* * *